# උතුරු මැද පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ පළාත් ආයුර්වේද කොමසාරිස් තනතුරට බඳවා ගැනීම.

උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩුව පවතින පළාත් ආයුර්වේද කොමසාරිස් තනතුර සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ නිලධාරින්ගෙන් දීපව්‍යාප්තව අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු අංකය | තනතුර | අවශ්‍ය සුදුසුකම් | පුරප්පාඩු සංඛ්‍යාව | පුරප්පාඩු පවතින සේවා ස්ථානය |
|---|---|---|---|---|
| 01 | පළාත් ආයුර්වේද කොමසාරිස් තනතුර | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම | 01 | පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව, උතුරු මැද පළාත |
| සටහන -: අයදුම්පත් භාරගන්නා අවසාන දින වන විට තනතුරට බඳවා ගැනීමට අදාළ සියළු සුදුසුකම් සපුරා තිබිය යුතු අතර, පහත 01 හි I, II, III සනාථ කරන සියළුම සහතික වල ඡායා පිටපත්, ජාතික හැඳුනුම්පතේ හා උප්පැන්න සහතිකයේ ඡායා පිටපත් අයදුම්පත සමඟ අමුණා එවිය යුතුය. | | | | |

01. බඳවා ගැනිමේ සුදුසුකම්:-

පහත දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ, පරිපාලන l ශ්‍රේණියට අයත් අයදුම්කරුවන් අතරින් ව්‍යුහගත සම්මුඛ පරික්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා ඉහත තනතුර සඳහා බඳවා ගනු ලැබේ.

සපුරාලිය යුතු සුදුසුකම්:-

2026.06.15 දිනට

(1) ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන l ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.
(11) අයදුම්පත් කැඳවන දිනට ආසන්න වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් පැවතීම.
(111) අයදුම්පත් කැඳවන දිනට ආසන්න වසර 05ක කාර්යය සාධන ඇගයීම සතුටුදායක මට්ටමින් හෝ ඉන් ඔබ්බට ළඟා කරගෙන තිබීම ද හා එම වර්ෂවලට අදාළව වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබීම .
(IV) ශ්‍රී ලාංකික පුරවැසියෙක් විය යුතුය.
(V) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

02. අයදුම්පත් කැඳවන අවසාන දිනය වන විට තනතුරට අවශ්‍ය සියළුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

03. සේවයේ නියුක්ත කරවිමේ කොන්දේසි:-
මෙම තනතුරට හිමි වැටුප රා.ප.ච 10/2025 හි SL-1-2025 - 82,150-10 x 2,400 – 8 x 2,940 -17x3,900 - 195,970 වැටුප් පරිමාණයෙහි 20 වන වැටුප් පියවර ආරම්භක වැටුප වේ.

04. වයස් සීමාව:-
දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වෛද්‍ය නිලධාරින් වෙතින් පමණක් දීපව්‍යාප්තව අයදුම්පත් කැඳවනු ලබන බැවින් වයස් සීමාවක් අදාළ නොවේ.

05. ව්‍යුහගත පරීක්ෂණය:-

මූලික සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටිය යුතු අතර එහිදී ජ්‍යෙෂ්ඨතාවය, කුසලතාවය හා අයුර්වේද වෛද්‍ය සේවයට ඉටු කර ඇති සුවිශේෂීය දායකත්වය ද කළමණාකරණ හැකියාවද සැලකිල්ලට ගෙන ලකුණු ලබා දෙනු ලැබේ.ඉහළම ලකුණු ලබාගන්නා අයදුම්කරු තනතුර සඳහා පත් කරනු ලැබේ.

06. අයදුම්කරුවන් විසින් මේ සමඟ ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුව පිළියෙළ කරගත් ජීව දත්ත තොරතුරු ඇතුළත් නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා/ අමාත්‍යාංශ ලේකම් මඟින්, අයදුම් කරන තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරණ තනතුරෙන් නිදහස් කළ හැකි බවට නිර්දේශය ද සමඟ 2026.06.15 වන දින හෝ එදිනට පෙර ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රය, උතුරු මැද පළාත, අනුරාධපුර යන ලිපිනය වෙත ලියාපදිංචි තැපැලෙන් ඉදිරිපත් කළ යුතුයි.

07. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් කැඳවීමේ දිනට සුදුසුකම් සම්පූර්ණ කර නොමැති අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ප්‍රමාද වීම හෝ නැතිවිම සම්බන්ධයෙන් කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. මෙම පුරප්පාඩුව සම්පූර්ණ කිරීම හෝ නොකිරීම හෝ මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙහි විධිවිධාන සලසා නොමැති කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීමේ අයිතිය උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරතුමා සතු වේ.

ලේකම්,<br>
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,<br>
උතුරු මැද පළාත,<br>
අනුරාධපුර.<br>
2026.05.22

උතුරු මැද පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ පළාත් ආයුර්වේද කොමසාරිස් තනතුරට පත් කිරීමට අදාළ ලකුණු ලබා දීමේ පටිපාටිය-2026

| නිර්නායක | ලකුණු ලබාදෙන ආකාරය | උපරිම ලකුණු |
|---|---|---|
| 01.ජොෂ්ඨතාවය | පරිපාලන1 ශ්‍රේණියේ සේවා කාලය සඳහා වසරකට ලකුණු 06 බැගින් (උපරිම ලකුණු 60) | 60 |
| 02. රෝහල් කළමනාකරණය පිළිබඳව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගෙන ඇති සුදුසුකම් | (අ) පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහතිකයකට - (ලකුණු 05)<br>(ආ) පශ්චාත් උපාධි සහතිකයකට - (ලකුණු 05) | 10 |
| 03.පළපුරුද්ද | (අ) රෝහල් හා ආයතන පරිපාලනය පිළිබඳව වසර තුනකට නොඅඩු පළපුරුද්දක් ලබා තිබිම - (ලකුණු 03)<br><br>(ආ) රෝහල් හා ආයතන පරිපාලනය පිළිබඳව වසර තුනකට පසුව සේවය කළ එක් එක් වසරක් සඳහා ලකුණු 01 බැගින් ) - (ලකුණු 02) | 05 |
| 04. ආයුර්වේද විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණය පිළිබඳව ලබාගත් අතිරේක අධ්‍යාපන සුදුසුකම් හා අතිරේක වෘත්තීය සුදුසුකම් | (අ) පශ්චාත් උපාධි සහතිකය සඳහා - (ලකුණු 15)<br>(ආ) පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහතිකය සඳහා - (ලකුණු 10)<br>(ඇ) ඩිප්ලෝමා සහතිකයක් සඳහා - (ලකුණු 05)<br>මීට අමතරව ලබා ඇති පහත සුදුසුකම් සඳහා<br>(ඈ) මාස 01 සිට 03 දක්වා පුහුණු/පාඨමාලා සහතිකයක් සඳහා - (ලකුණු 01)<br>(ඉ) මාස 03 ට (වැඩි) සිට 06 දක්වා පුහුණු/පාඨමාලා සහතිකයක් සඳහා - (ලකුණු 02)<br>(උ) මාස 06 (වැඩි) සිට අවු 01 දක්වා පුහුණු/පාඨමාලා සහතිකයක් සඳහා - (ලකුණු 03)<br>(ඌ) අවු 01ට වැඩි පුහුණු/පාඨමාලා සහතිකයක් සඳහා - (ලකුණු 04)<br>එක් විෂය ක්ෂේත්‍රයකට අදාළව ලබාගත් උපරිම සුදුසුකමට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.<br>රජයේ පිළිගත් ආයතනයකින් අදාළ සහතික පත්‍ර ලබාගෙන ඉදිරිපත් කල යුතුවේ. | 15 |
| 05. වෙනත් සුදුසුකම් | (අ) සේවයට බඳවා ගැනීමේ භාෂාවට අමතරව ලබා ඇති වෙනත් භාෂා ප්‍රවීණතා පිළිබඳ දැනුම සඳහා (රජයේ පිළිගත් ආයතනයකින් සහතික පත්‍ර පාඨමාලාවක් හෝ ඊට සමාන පාඨමාලාවක් හදාරා තිබීම හා එය සහතිකයක් මගින් සනාථ කර තිබිය යුතුවේ. ) (ලකුණු 01)<br><br>(ආ) ප්‍රශංසා හා ජයග්‍රහණ සඳහා (ලබාගෙන ඇති ප්‍රශංසා හා ජයග්‍රහණ සම්බන්ධව ලිඛිතව සනාථ කර තිබිය යුතුවේ. ) (ලකුණු 01)<br><br>(ඇ) ආයුර්වේද ක්ෂේත්‍රයේ ප්‍රගමණයට දක්වා ඇති විශේෂ දායකත්වය සඳහා (ලකුණු 03) | 05 |
| 06.කුසලතාවය | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය සඳහා -(ලකුණු 05) | 05 |
| මුළු ලකුණු | | 100 |

**අයදුම් පත්‍රය.**

**උතුරු මැද පළාත් අයුර්වේද කොමසාරිස් තනතුර සඳහා බඳවා ගැනිම.**

1.අයදුම්කරුගේ සම්පූර්ණ නම:- ..........................................................................................................

2. මුලකුරු සමඟ නම ඉංග්‍රිසියෙන්:- ...................................................................................................

3. රාජකාරි ලිපිනය:- ...........................................................................................................................

4. පෞද්ගලික ලිපිනය:- .......................................................................................................................

5. උපන් දිනය :- ....................................................2026.06.15 දිනට වයස...........................

6. ස්ත්‍රී /පුරුෂ භාවය:-................................................................

7.ජාතික හැඳුනුම්පත් අංකය:- .................................................................................................................

8. දුරකථන අංකය :- රාජකාරි................................................... ජංගම:- ................................

9. මුල් පත්වීම ලද දිනය:- ................................... පත්වීම් ලිපියේ අංකය හා දිනය:-..........................

.............................................................................................................................................................

10.සේවය ස්ථිර කරන ලද දිනය:- ..........................................................................................................

11.ශ්‍රි ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ II ශ්‍රේණියට පත්වු දිනය:-..........................................

I ශ්‍රේණියට පත්වු දිනය:-.............................................

පරිපාලන II ශ්‍රේණියට පත්වු දිනය:-...........................

පරිපාලන I ශ්‍රේණියට පත්වු දිනය:-...........................

12. දැනට දරණ තනතුර හා ඊට පත්වූ දිනය:- ...........................................................................

සේවා කාලය තුළ පත් වූ :-

| තනතුර | තනතුරට පත් වූ දිනය | සේවා කාලය |
|---|---|---|
| | | |

13. පශ්චාත් උපාධි/ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පිළිබඳ තොරතුරු.

| ලබා ඇති පශ්චාත් උපාධි/ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | ලබා ගත් ආයතනය | කාල සීමාව | සුදුසුකම් සපුරා ඇති දිනය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

14. ආසන්න වසර 05 ක වාර්ෂික කාර්ය සාධනය අනුව අවසාන ඇගයීම.

| වර්ෂය | අවසාන ඇගයීම<br>විශිෂ්ඨයි/ සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහලයි/ සතුටුදායකයි/ අසතුටුදායකයි |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

15. ලබා ඇති වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර: ...........................................................................................
.......................................................................................................................................................

16. විශේෂ සුදුසුකම්: ............................................................................................................................
.......................................................................................................................................................
.......................................................................................................................................................

17. වෙනත් තොරතුරු: .............................................................................................................................
.......................................................................................................................................................

18. ලබා ඇති දේශීය හා විදේශීය පුහුණු පිළිබඳ තොරතුරු: ..................................................................................
.......................................................................................................................................................
.......................................................................................................................................................

ඉහත සඳහන් තොරතුරු මාගේ දැනිමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය බවටත්, නිවැරදි බවටත් සහතික වෙමි. සාවද්‍ය තොරතුරු සැපයිම මත විනයානුකූල දඬුවමකට ලක්වන බව දනිමි.

දිනය: ..........................                                    ........................................................

අත්සන

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය:-**

.................................................................... ලෙස සේවය කරන ......................................................
............................ (සේවය ) ..................... ..... ( ශ්‍රේණියේ) .............................................................

මහතා/මිය පූර්වාසන්න වර්ෂ 05ක සියළු වැටුප් වර්ධක උපයා ඇති/නැති බවත්, පූර්වාසන්න වර්ෂ 05ක කාලයේදී නිලධාරියාට /නිලධාරිණියට විරුද්ධ විනයානුකූල කටයුතු සිදුකර ඇති/නැති බවත්, ඉදිරියේදී නිලධාරියාට/නිලධාරිණියට විරුද්ධ විනයානුකූල කටයුතු කිරීමට අදහස් කර ඇති/නොමැති බවත් සහතික කරමි. ඉහත සඳහන් තනතුරට ඔහු/ඇය සුදුසුකම් ලබන/නොලබන බව සඳහන් කරන අතර එම තනතුරට බඳවා ගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරණ තනතුරෙන් නිදහස් කළ හැකි බවද නිර්දේශ කරමි./නොකරමි.

දිනය: ..........................                                    ..................................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

**අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය:-**

....................................................................... ලෙස සේවය කරන ......................................................

............................ (සේවය ) ..................... ..... ( ශ්‍රේණියේ) ..................................................................

මහතා/මිය පූර්වාසන්න වර්ෂ 05ක සියළු වැටුප් වර්ධක උපයා ඇති/නැති බවත්, .................................................. (සේවය) පූර්වාසන්න වර්ෂ 05ක කාලයේදී නිලධාරියාට /නිලධාරිණියට විරුද්ධ විනයානුකූල කටයුතු සිදුකර ඇති/නැති බවත්,ඉදිරියේදී නිලධාරියාට/නිලධාරිණියට විරුද්ධ විනයානුකූල කටයුතු කිරීමට අදහස් කර ඇති/නොමැති බවත් සහතික කරමි. ඉහත සඳහන් තනතුරට ඔහු/ඇය සුදුසුකම් ලබන/නොලබන බව සඳහන් කරන අතර එම තනතුරට බඳවාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරණ තනතුරෙන් නිදහස් කළ හැකි බවද නිර්දේශ කරමි./නොකරමි.

දිනය :- ...............................................          ......................................................................

අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන හා නිල මුද්‍රාව